**පියැසි මත සූර්ය බලශක්ති උත්පාදන ණය මාලා ව්‍යාපෘතිය - 2021**

---------------------------------------------------------------------------

පියැසි මත සූර්ය බලශක්ති උත්පාදන ණය මාලා ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ අරමුදල් උපයෝගි කර ගැනීමේ ප්‍රකාශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2018 සැප්තැම්බර් 18 දින එළඹි අංක 3571- SRI දරන ණය ගිවිසුමේ 03 වන උපලේඛනයේ 27 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------------

ණය ගිවිසුමට අනුව, මුදල් අමාත්‍යාංශය ව්‍යාපෘතියේ විධායක නියෝජිතායතනය වන අතර ශ්‍රී සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ ප්‍රධාන ධාරාවේ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය, බලශක්ති උත්පාදන ධාරිතාව ඉහළ නැංවීම සහ රටෙහි පාරිසරික තත්ත්වයන් වැඩිදියුණු කිරීමයි. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ තක්සේරු කළ මුළු පිරිවැය රු.මිලියන 7,550 කට සමාන එජඩො මිලියන 50 ක් වන අතර ආසියානු සංවර්ධන බැංකුව විසින් මුළු මුදලම මූල්‍යකරණය කිරීමට එකඟ විය. ව්‍යාපෘතියේ කටයුතු 2019 අප්‍රේල් 17 දින ආරම්භ කර තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

## 1.3 මතය

------

පියැසි මත සූර්ය බලශක්ති උත්පාදන ණය මාලා ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා වූ අරමුදල් උපයෝගි කර ගැනීම පිළිබඳ ප්‍රකාශය, පියැසි මත සූර්ය බලශක්ති උත්පාදන ණය මාලා ව්‍යාපෘතියේ උපකාරක ණය ගිවිසුම්වලට සහ ණය ගිවිසුමේ 27 (අ) වගන්තියේ දක්වා ඇති ඒ හා සමාන අවශ්‍යතාවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

--------------------------------------------------------------------------------------------------------

අරමුදල් උපයෝගි කර ගැනීම පිළිබඳ ප්‍රකාශය, පියැසි මත සූර්ය බලශක්ති උත්පාදන ණය මාලා ව්‍යාපෘතියේ උපකාරක ණය ගිවිසුම්වලට සහ ණය ගිවිසුමේ 27 (අ) වගන්තියේ දක්වා ඇති ඒ හා සමාන අවශ්‍යතාවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව අරමුදල් උපයෝගි කර ගැනීම පිළිබඳ ප්‍රකාශය පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස අරමුදල් උපයෝගි කර ගැනීම පිළිබඳ ප්‍රකාශය, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම අරමුදල් උපයෝගි කර ගැනීම පිළිබඳ ප්‍රකාශය පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් අරමුදල් උපයෝගි කර ගැනීම පිළිබඳ ප්‍රකාශයේ ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- අරමුදල් උපයෝගි කර ගැනීම පිළිබඳ ප්‍රකාශයේ ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් අරමුදල් උපයෝගි කර ගැනීම පිළිබඳ ප්‍රකාශයේ සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්ය සාධනය

---------------------------

### 2.1 භාවිතයට නොගත් සම්පත්

------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| 2021 වසර අවසන් වන විට සූර්ය බලශක්තිය නිපදවීම සඳහා ප්‍රතිලාභීන් 5,449 ක් සඳහා රුපියල් මිලියන 9415.25 ක් නිදහස් කර තිබුණි. තවද, දිවයින පුරා ව්‍යාපෘතියේ ණය ව්‍යාප්තිය සලකා බැලීමේදී පවතින දැඩි හිරු රශ්මිය හේතුවෙන් මන්නාරම, ත්‍රිකුණාමලය, වවුනියාව, අම්පාර සහ මඩකලපුව වැනි වැඩි බලශක්ති උත්පාදනය කිරීමේ හැකියාව ඇති දිස්ත්‍රික්ක සඳහා ණය ලබාදීමේ හිඟයක් පවතින බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතියේ දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගතිය සැලකූ විට, සමහර දිස්ත්‍රික්ක ඉහළ කාර්ය සාධනයක් ඇති දිස්ත්‍රික්කවලට වඩා අඩු ව්‍යාපෘති සංඛ්‍යාවක් පෙන්නුම් කරයි. මෙය සහභාගී වන මූල්‍ය ආයතන 10 ක් හරහා දීප ව්‍යාප්ත ව්‍යාපෘතියක් විය. | දැඩි හිරු එළිය පවතින දිස්ත්‍රික්ක කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් සූර්ය බලශක්ති උත්පාදනය දිරිගැන්වීමට කටයුතු කළ යුතු වීම. |